# මාධ්‍ය නිවේදනය

ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ
2017 දෙසැම්බර් 05

**එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව වෙළඳ හා ප්‍රවාහන සහයෝගිතාව ශක්තිමත් කරයි.**

දෙසැම්බර් 04 ශ්‍රී ලංකාව : භාණ්ඩ ශ්‍රී ලංකාවේ සිට කාර්යක්ෂම ලෙස ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස සිවිල් ගුවන් සේවා ලේකම් පී. එස්. විතාන මහතා සහ ශ්‍රී ලංකා හා මාලදිවයින් ඇමෙරිකානු තානාපති අතුල් කෙෂප් මහතා විසින් 2002 වර්ෂයේදී ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර එළඹෙන ලද විවෘත ගුවන් ගිවිසුම සංශෝධනය කිරීම සඳහා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම සංශෝධනය මගින් ගෝලීය වශයෙන් භාණ්ඩ ඉක්මනින් බෙදා හැරීම ශක්තිමත් කිරීම ද්විපාර්ශ්විය සම්බන්ධතා හා තරඟකාරිත්වය ඉහළ නැංවීම සහ ආර්ථික වර්ධනය හා රැකියා උත්පාදනය කිරීම සඳහා පහසුකම් සැලසීම සිදු කරනු ලැබේ.

"අපගේ ද්විපාර්ශ්වික විවෘත ගුවන් ගිවිසුම සංශෝධනය කිරීම පිළිබඳ මෙම ගිවිසුම මගින් එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර ඇති දිගුකාලීන හා ශක්තිමත් වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ." යනුවෙන් කෙෂප් මහතා ප්‍රකාශ කලේය. "අප දෙරටෙහි පුරවැසියන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කරනු ලබන සහ ආර්ථික වර්ධනයක් ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ සහකරු ලෙස ඇමෙරිකානු එක්සත් ජනපදය අපේක්ෂා කරයි."

2017 දෙසැම්බර් මස 4 සහ 8 කාලය තුලදී කොළඹදී පවත්වනු ලබන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ දසවන ගුවන් සේවා සමාලෝචන සමුළුවේදී මෙම සංශෝධනය ගිවිසුමට අත්සන් කිරීම සිදු කරන ලදී. මෙම සමුළුවේදී එක්සත් ජනපදය විසින් රටවල් 12ක් හමු වන අතර සියලුම භාණ්ඩ මෙහෙයුම් පිළිබඳ අයිතිවාසිකම් හත ඇතුලත් කරමින් දැනට පවතින ගුවන් සෙවා ගිවිසුම් සංශෝධනය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර එක්සත් ප්‍රවාහකයන්ගේ අයිතිවාසිකම් පුලුල් කිරීමට එකඟ වනු ලැබේ. ද්විපාර්ශ්වික පාර්ශ්වයේ රජයන් සමග සාකච්ඡා කර ව්‍යාපාරික ගැටලු නිරාකරණය කර ගැනිමට සහ එක්සත් ජනපද ප්‍රවාහකයින් සඳහා නව අයිතිවාසිකම් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දීමද මෙම වසරේ සමුළුව මගින් සිදු කරනු ලැබේ.

රජය හා ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් එක්සත් ජනපද දූත කණ්ඩායමට ඇතුලත්වේ.

එක්සත් ජනපද ගුවන් සේවා ප්‍රතිපත්තිමය සහ විවෘත අහස් ගිවිසුම පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුවේ https://www.state.gov./e/eh/tra/ata වෙබ් අඩවියේ අඩංගුවේ.



එක්සත් ජනපද ශ්‍රී ලංකා විවුර්ත ගුවන් ගිවිසුම සංශෝධනය කිරීම සදහා ගිවිසුමක් සිවිල් ගුවන් සේවා ලේකම් ජී.එස්. විතානගේ සහ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සදහා එක්සත් ජනපද තානාපති අතුල් කෙෂප් විසින් අත්සන් කරන ලදී. මේ තුළින් ආර්ථීක සංවර්ධනය ද්වීපාර්ශික සබදතා සවිමත් වීම සහ රැකියා අවස්ථාවන් බිහිවීම අපේක්ෂා කෙරේ.